# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - දකුණු පළාත
## கூட்டுறவு அபிவிருத்தி திணைக்களம் - தென் மாகாணம்
## DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT - SOUTHERN PROVINCE

147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල. 147/3, பெட்டிகலவத்தை, காலி. 147/3, Pettigalawatta, Galle.

| | | |
|---|---|---|
| කොමසාරිස් / ஆணையாளர் / Commissioner } 091-2235950 | කාර්යාලය / ෆැක්ස් / அலுவலகம் / பேக்ஸ் / Office / Fax } 091-2234380 | විද්‍යුත් තැපැල / ஈ-மேல் / E-mail } coopdepartment@sltnet.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } දපස/සමු.සං./සං/18/02 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2019.02.13 |

පොදු චක්‍රලේඛ/01/2019

සියළුම සමුපකාර සමිතිවල ගරු සභාපතිවරුන්/ලේකම්වරුන් වෙත.

<u>සමූපකාර සමිති වල අරමුදල් භාවිතා කර විදේශීය සංචාර සඳහා සහභාගි වීම.</u>

දකුණු පළාතේ විවිධ සේවා සමූපකාර සමිති හා ද්විතීය මට්ටමේ සමූපකාර සමිති භාරව කටයුතු කරන සමූපකාර සංවර්ධන නිලධාරීන් හා දකුණු පළාත් සමූපකාර දෙපාර්මේන්තුවේ සේවය කරන වෙනත් නිලධාරීන් සමිති වල ඉල්ලීම් මත සමූපකාර සමිති වල අරමුදල් භාවිතාකර විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා විදේශීය සංචාර සඳහා සහභාගී වී ඇති බවට මවිසින් සිදුකරන ලද පරීක්ෂණ වලදී හා සමිතිවල සිදුවන විවිධ අක්‍රමිකතා සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු හා ආයතන මගින් සිදුකරන ලද පරීක්ෂණ වලදී අනාවරණය වී ඇත.

02. මෙම පරීක්ෂණ වලදී බොහෝ අවස්ථාවල දෙපාර්මේන්තු නිලධාරීන්ද චෝදනාවන්ට ලක්වී ඇති අතර මෙම තත්වයන් තුල වර්තමානය වන විට දෙපාර්තමේන්තුව, රාජකාරී ස්වාධීනව සිදුකිරීම සම්බන්ධව අභියෝගයන්ට ලක්වෙමින් පවතී. එබැවින් 2019.03.01 දින සිට සමූපකාර සමිති වල අරමුදල් භාවිතා කර විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා විදේශීය සංචාර සඳහා කිසිදු දෙපාර්මේන්තු නිලධාරියෙකුට සඳහා සහභාගි විය නොහැකිය.

03. නමුත් සමූපකාර සමිතිවල නිලධාරීන් හා සේවකයන් කණ්ඩායම් වශයෙන් විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා විදේශීය සංචාර සඳහා සහභාගි වන අවස්ථාවක පමණක් එකී සංචාරයට දෙපාර්තමේන්තු නිලධාරියෙක් සහභාගි වීමේ අවශ්‍යතාවය හා එහි ඇති වැදගත්කම සම්බන්ධව අදාල සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය/ කාරක සභාව තීරණය කර අරමුදල් යෙදවීමට ඇති හැකියාව සනාථ කර දෙපාර්තමේන්තු නිලධාරියෙකු මේ සඳහා සහභාගි කරන ලෙසට දිස්ත්‍රික් භාර සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ගේ නිර්දේශ සහිත ඉල්ලීමක්

ලද අවස්ථාවක ඒ පිළිබඳ සලකා බලා සුදුසු නිලධාරියෙකු නම් කිරීමට කොමසාරිස්වරයාට හැකියාව ඇත.

04. මෙවැනි සංචාරයකට සහභාගී වන දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අදාල සංචාරයෙන් පසු මාසයක් තුල අදාල ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හෝ විදේශීය සංචාර මගින් ලබාගත් දැනුම, අත්දැකීම් හා පුහුණුව උපයෝගී කරගෙන අදාල සමිතිය සඳහා ක්‍රියාත්මක සැලස්මක් /නව ව්‍යාපෘතියක් හඳුන්වාදීම සඳහා කටයුතු කළයුතු අතර ඒ පිළිබඳ වාර්තාවක් මා වෙත ඉදිරිපත් කළ යුතුවේ.

එන්.ඒ.කේ.එල්. විජේනායක,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

එන්. ඒ.කේ.එල්. විජේනායක
සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත් :-

1. ස.සං.සහකාර කොමසාරිස් - පාලන - දැ.පි හා අ.ක.ස
2. ස.සං.සහකාර කොමසාරිස් ගාල්ල/මාතර/හම්බන්තොට,- දැ.පි හා දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමට.